RARE

# ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සමයක සංහිඳියාව සංවර්ධනය හා සන්නිවේදනය

(ගුවන්විදුලි මාධ්‍යයට විශේෂිතව කෙරෙන ක්ෂේත්‍ර අධ්‍යයනයකි)

H.M.C. කුමාර

FGS/03/02/06/2011/16

දර්ශනපති ජන සන්නිවේදන උපාධිය පූරණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

ප්‍රවේශ අංකය: 1249
වර්ග අංකය:

පෙබරවාරි 2015

# නිබන්ධන සාරාංශය


ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සමයක සංහිඳියාව, සංවර්ධනය හා සන්නිවේදනය නැමති මාතෘකාව ඔස්සේ ගුවන්විදුලියට විශේෂිතව මේ පර්යේෂණ ග්‍රන්ථය සකස් කර තිබේ. සංවර්ධන සන්නිවේදනය හා පශ්චාත් යුද සමයේ සංහිඳියාව මෙහි විෂය ක්ෂේත්‍ර අතරට ගෙන ඇත. ශ්‍රී ලංකාවේ වත්මන් තත්වය පිළිබඳ අවධානය යොමු කරමින් පර්යේෂණාත්මක ග්‍රන්ථයක් මෙතෙක් පලවී නොමැත. නිදහස ලැබී අඩ සියවසකට අධික කාලයක් ගතවී ගියද තවමත් ශ්‍රී ලාංකික ජාතියක් බිහි නොවූයේ ඇයි යන ගැටලුව ඔස්සේ මේ පර්යේෂණය සිදු කර ඇත. මෙහි අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සමයක මහජන මතයට බලපාන සංකීර්ණ හා සියුම් කරුණු හඳුනා ගැනීමයි. උපකල්පනය ලෙස යොදාගෙන ඇත්තේ පශ්චාත් යුද සමයක ජාතීන් අතර සංහිඳියාව ගොඩ නැගීමට ගුවන්විදුලිය ප්‍රමාණවත් දායකත්වයක් ලබා දී නොමැත යන කරුණයි. ඒ පිළිබඳ විමර්ශනයට ගුවන්විදුලි නාලිකා 4 ක් උපයෝගී කරගෙන තිබේ.

දත්ත රැස් කිරීම සඳහා නියැඳිය, ප්‍රශ්න මාලා, සම්මුඛ සාකච්ඡා යොදාගෙන තිබේ. නිරීක්ෂණය මගින්ද තොරතුරු ලබා ගැණින. ඒ සඳහා වව්නියාව පූන්තෝට්ටම් කඳවුර තෝරා ගැනීමට හැකි විය. ප්‍රාථමික මෙන්ම ද්විතීක දත්ත පරිහරණය කර තිබේ. පුස්තකාල අධ්‍යයනය මගින් තොරතුරු ලබා ගැනීමට හැකි විය. ගුවන්විදුලි බලධාරීන්ගෙන් හා රජයේ නිලධාරීන්ගෙන්ද ග්‍රන්ථයට අවශ්‍ය තොරතුරු ලබා ගෙන ඇත.

පශ්චාත් යුද සමය තුළ ශ්‍රී ලංකාවට අභියෝග රැසකට මුහුන දීමට සිදු විය. එය දෙස් විදෙස් ලෙස වෙන් කර දැක්විය හැකිය. ජාත්‍යාන්තරයෙන් එල්ල වූ අභියෝග එහිදී මූලික විය. ඒවා නිරාකරණය කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම මත ගැටලු උත්සන්න විය. අවශ්‍ය දැනුවත් කිරීම සඳහා යාන්ත්‍රණයක්ද සකස් කර නොමැත. සංහිඳියාව ඇති කරමින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ගුවන්විදුලිය ප්‍රමාණවත් දායකත්වයක් ලබා දී නොමැත. ජනතාව අතර සහයෝගීතාව ගොඩ නැගීමට අවශ්‍ය මූලික ක්‍රියා මාර්ගද ගෙන නොමැත. මෙම ගැටලු සමථයකට පත් කිරීම සඳහා යෝජනා ගනනාවක් ඉදිරිපත් කල හැකිය. නිවැරදි භාෂා ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හා ජනතාවට ඒකරාශී විය හැකි මධ්‍යස්ථාන ඉදි කිරීමද ඒ අතර වෙයි. සංහිඳියාව පිළිබඳව පාසල් විෂය මාලාවට ඒකකයක් ඇතුලත් කල යුතුය. ප්‍රජා මහජන ගුවන්විදුලි සංකල්පයක්ද ඉදිරිපත් කර තිබේ.



මූලික පද - සන්නිවේදනය, සංවර්ධනය, සංහිඳියාව, ගුවන්විදුලිය, පශ්චාත්යුද,

Co-existence, development and communication

of the postwar of Sri Lanka

**Abstract**

This thesis is compiled as an experiment related to radio on co-existence, development and communication; of the postwar of Sri Lanka. So far a book has not been published giving attention to the present situation in Sri Lanka. It is since half a century, we obtained freedom. But a question is raise as to way a "Sri Lankan Nation" has not been built. Basis of this publication is to identify the salient points which influence the ideas of the public on postwar of Sri Lankan Radio has not been done satisfaction contribution to build up co-existence among different races. Four radio channels were used for this experiment.

Date wore obtained from the people was Punthottam Camp in Vavuniya. Collation of data was don on the methodology of questions and interviewers primary and secondary data were used. Attention was also drawn on the background of the experiments and books on literature. Answers were obtained necessary automation form the heads and administrative others of Radio channels. Decisions were arrived by comparing the information obtained.

Problems faced by Sri Lanka after the war was discussed. An analysis was done on the problems and reasons for the contribution of such problems no mechanism is implemented to educate the responsible persons. Radio has also not extended sufficient contribution. Suitable suggestions were made to overcome the problems they are; methodology for co-existence and introduction of a new Radio concept. Implementation of a language policy is also a very important impact.

**Key Words :**

**Communication, Development, Radio, Coexistence, postwar**